සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Covid 19 සති පාසල් වැඩසටහන
නාට්‍ය හා රංග කලාව
13 ශ්‍රේණිය- තෙවන වාරය
කාලය 2020/06 /22 - 2020/06/26

**නිපුණතාව:** නාට්‍ය හා රංග කලා විෂයට අනුබද්ධිත කලා අධ්‍යයනය කර වෘත්තීය කුසලතා සංවර්ධනය කර ගනී.

**නිපුණතා** මට්ටම: 7.1.1

**පාඩම :** රචනා කරන ලද කෙටි නාට්‍ය පෙළට අදාලව ආනුෂංගික කලා භාවිතා කර නාට්‍ය නිෂ්පාදනය කිරීම.

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

1. කෙටි නාට්‍යය වේදිකා අලංකරණ සැළසුම්කරණය සම්බන්ධයෙන් නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.
   (1). පරිහරණය පහසු විය යුතුය.
   (2). ප්‍රේක්ෂක මනසේ චිත්‍ර රූප මැවෙන අයුරින් තිබිය යුතුය.
   (3). සරලව නිර්මාණය කිරීමෙන් නාට්‍යයේ අදහසට හානි සිදු වේ.
   (4). නාට්‍යයේ පසුබිම නිවැරදිව ප්‍රකාශ විය යුතුය.
   (5). නාට්‍යයේ අර්ථය ප්‍රකට විය යුතුය. (..........)

2. කෙටි නාට්‍යයක සංගීත හා සම්බන්ධයෙන් වඩා ගැලපෙන ප්‍රකාශය තෝරන්න.
   (1.) පටිගත කළ සංගීතය පමණක් භාවිතයට ගැනේ.
   (2.) ජේමාව හා අවස්ථාව සිදු කිරීමට යොදා ගැනේ.
   (3.) සුවිසල් වාද්‍ය වෘන්දයක් යොදා ගැනීම සිදු වේ.
   (4.) සංගීතඥයාට අභිමත පරිදි ගායනා යොදා ගැනේ.
   (5.) පසුබිම් සංගීතය පමණක් භාවිත කෙරේ (..........)

3. කෙටි නාට්‍යයකට රංගාලෝකය යෙදීම සම්බන්ධයෙන් වඩාත් ගැලපෙන ප්‍රකාශය තෝරන්න.
   (1.) රංගාලෝක සැළසුමක් අනවශ්‍ය නොවේ.
   (2.) රංගාලෝක ශිල්පියාගේ අභිමතය පරිදි පමණක් සටහන් කළ යුතුය.
   (3.) රංගාලෝකය යනු අනවශ්‍ය කරුණක් නොවන්නට ද පුලුවන.
   (4.) වර්ණ ඉස්මතු කර ගැනීමට එතරම් පිටු බලයක් නොදේ.
   (5.) අංග රචනා ශිල්පියා හා රංගාලෝක ශිල්පියා අතර සම්බන්ධතාවයක් අනවශ්‍ය නොවේ. (..........)

4. **"අ"** හි සඳහන් කෙටි නාට්‍ය හා **"ආ"** හි සඳහන් කෙටි නාට්‍ය කරුවන් පිළිවෙලින් ගැලපූ විට නිවැරදි වරණය තෝරන්න

| "අ" | "ආ" |
|---|---|
| 1 ඔබ සාපේක්ෂයි | (A)චාමික හත්ලහවත්ත |
| 2 ඇ වරයි දෑ වරයි | (B)කපිල කුමාර කාලිංග |
| 3 යක්කුරේ ඉස්තෝලේ | (C)ධනංජය කරුණාරත්න |
| 4 දහයට විතර | (D)මංගල සේනානායක |
| 5 රූපයේ ප්‍රේමය හා ප්‍රේමයේ රූපය | (E)ඇන්ටනී ජයලත් |

1 CEABD  2 ABCDE  3 CEBDA  4 EDCBA  5 CEDBA (..........)

## II කොටස

1. පහත සඳහන් කතා සැලසිල්ල හා සපයා ඇති චරිත අතරින් තුනක් පමණක් තෝරාගෙන කෙටි නාට්‍ය පිටපතක් රචනා කරන්න.

   පෘථිවිය මෙන් තුන් ගුණයක් විශාල උල්කාපාතයක් අධික වේගයකින් පෘථිවිය කරා පැමිණෙන බවත් තවත් අඩහෝරාවකින් උල්කාව පෘථිවිය හා ගැටීමට නියමිත බවත් ගුවන් විදුලියෙන් අසන්නට ලැබේ...

   (මෙකී චරිත අතරින් තුනක් පමණක් තෝරා ගන්න.)

   (මෙහෙණින් වහන්සේ නමක්, හොරෙක්, මහලියක්, පාසල් සිසුවෙක්, සිඟන්නෙක්, උන්මත්තකයෙක්, ගුරුවරයෙක්)

2. ඔබ විසින් රචිත කෙටි නාට්‍ය පිටපතට අදාළව පසුතල නිර්මාණයකට සුදුසු දළ සැලැස්මක් අඳින්න.

3. ඔබ විසින් රචිත කෙටි නාට්‍ය පිටපතට එක් කළ චරිත සඳහා අංග රචනා සැලසුම් සකසන්න.

4. ඔබ විසින් රචිත කෙටි නාට්‍ය පිටපතකින් හමුවන චරිතවලට උචිත රංගවස්ත්‍ර සඳහා සැලසුම් සකසන්න.

5. කෙටිකතා නාට්‍යයකට හා දිගු නාට්‍යයකට ආනුෂංගික අංග සැලසුම් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ සාකච්ඡා කරන්න.